අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED//1/14/02/07-2018 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2018.03. 27

චක්‍රලේඛ අංක - 16/2018

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු
විභාග කොමසාරිස් ජනරාල්
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම පළාත් විද්‍යා විෂය සම්බන්ධීකරණ නිලධාරීන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියළුම විද්‍යා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු
සියලුම විදුහල්පතිවරු
සියලුම විද්‍යා විෂය ගුරු උපදේශකවරු

**2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව විද්‍යා විෂයය නිර්දේශය හදාරන සිසුන් 2019 වර්ෂයේ සිට ඉදිරියට අ.පො.ස (උ/පෙළ) විභාගයට සූදානම් කිරීම**

අ.පො.ස (උ/පෙළ) නව විද්‍යා විෂය නිර්දේශය 2017 වර්ෂයේ සිට පාසල්වල ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී. මෙම විෂය නිර්දේශයට අදාළව ප්‍රථම ජාතික මට්ටමේ අ.පො.ස. (උ/පෙළ) විභාගය 2019 වර්ෂයේ දී පැවැත්වීමට නියමිතය.

එහි දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව හා ජීව විද්‍යාව යන විෂය නිර්දේශයන් හි ඇතුළත් කර ඇති ඉගෙනුම් ඵල මගින් අදාළ විෂය කොටස් යටතේ ඉගෙනුම ලැබිය යුතු සීමාවන් දක්වා ඇත. ඒ අනුව ඉගෙනුම් ඵලවල දක්වා ඇති සීමාවන් යටතේ පමණක් ප්‍රශ්න සැකසීමට විභාග දෙපාර්තමේන්තුව තීරණය කර ඇත. එම නිසා 2019 වර්ෂයේ සිට ඉදිරියට අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීමේ දී මෙම සීමාවන් ඉක්මවා නොයන බව සියලුම විදුහල්පතිවරුන්, අදාළ විෂය භාර නිලධාරීන්, ගුරු උපදේශකවරුන්, ගුරුවරුන් , සිසුන් සහ දෙමාපියන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එසේම සිසුන් විභාගය සඳහා සූදානම් කිරීමේ දී මෙම කරුණු පිළිබඳ අවධානය යොමු කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

සුනිල් හෙට්ටිආරච්චි
අධ්‍යාපන ලේකම්

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832 | +94112784825 | minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811 | +94112785162 | secretary.education@moe.gov.lk